00025 (සියලුම හිමිකම් ඇවිරිණි)

## ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

### ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවයේ නිලධාරීන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2013 (1)

### පරිපාලනය (04)

කාලය පැය 03 යි.

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.

1. එකම බඳවා ගැනීමේ හා උසස්කිරීමේ පටිපාටියක් හෝ සේවා ව්‍යවස්ථාවක් හෝ අදාළ වන නිලධරයන් අතර ගැටුම් ඇතිවීම වලකාලීම සඳහා ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨත්වය තීරණය කිරීමට ප්‍රමාණවත් නිර්ණායකයන් පවතින්නේද? අදාළ විධිවිධාන ඇසුරින් සාකච්ඡා කරන්න.

2. “තමා විසින් අයදුම් කරන ලද තනතුරක් සඳහා තමන් පත් නොකිරීම පිළිබඳව පත් කිරීම් බලධරයා වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අභියාචනා කිරීමට සාමාන්‍ය පුරවැසියෙකුට හැකියාව තිබේ ද?” යන්න පැහැදිලි කර, රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අභියාචනා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අදාළ විධිවිධාන විස්තර කරන්න.

3. රජයේ නිලධරයන් සම්බන්ධව විනය ක්‍රියාවලිය තුළ “දෙපාර්ශවයටම සවන් දෙන්න” යන ස්වභාවික යුක්තියේ මූලධර්මය තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් විධිවිධාන පවතී. විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

4. රජයේ නිලධරයෙකුට එරෙහිව අධිකරණයක් විසින් හෝ ව්‍යවස්ථාපිත බලධරයෙකු විසින් හෝ පනවනු ලබන නියෝග සම්බන්ධයෙන් විනය බලධරයෙක් විසින් ගතයුතු පියවර පැහැදිලි කරන්න.

5. “විධිමත් විනය පරීක්ෂණයකදී චූදිතට එරෙහිව නගා ඇති චෝදනා ඔප්පු කිරීම සඳහා තීරණාත්මක කාර්ය භාරයක් පැමිණිල්ල මෙහෙයවීමේ නිලධරයා වෙත පැවරේ.” මෙම තත්ත්වය තහවුරු කිරීම පිණිස, පැමිණිල්ල මෙහෙයවීමට අදාළව ආයතන සංග්‍රහයේ පවත්නා විධිවිධාන වැඩි දියුණු කිරීම සඳහා වන ඔබගේ යෝජනා ඉදිරිපත් කරන්න.

6. රාජකාරි ලිපි ලේඛනවල භාරය, ඒවා ආරක්ෂා කර තබා ගැනීම සහ විනාශ කර දැමීමට අදාළ විධිවිධාන පැහැදිලි කරන්න.

7. නිල තත්ත්වයෙන් රජයේ නිලධරයෙකුට එරෙහිව පවරා ඇති නඩුවක දී වගඋත්තර කියා සිටීමට අදාළව එම රජයේ නිලධරයා කෙරෙහි බලපවත්නා බවට ආයතන සංග්‍රහයෙහි දැක්වෙන විධිවිධාන මොනවාද?

8. කෙටි සටහන් ලියන්න

   8.1. ආද්ශක පදනම මත කරනු ලබන පත් කිරීම්
   8.2. රජයේ නිලධරයා
   8.3. චෝදනාපත්‍රයක් සංශෝධනය කිරීම
   8.4. ක්ෂේත්‍ර නිලධරයන්ගේ ඉදිරි වැඩසටහන්

**********************